පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය:79
ආයතනයේ නම : ජනමාධ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතනය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டிலக்கம் - 79
நிறுவனத்தின் பெயர் : வெகுசன ஊடக அமைச்சு
பாராளுமன்ற அரசாங்க கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119 (4) கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்பு மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் பாராளுமன்றத்திற்கு முன்வைத்தல்.

Parliamentary Series No.79
Name of the Institution : Ministry of Mass Media

Submission of observations of the Hon. Minister in charge of the institution and steps taken with regard to the reports tabled by The Committee on Public Account in terms of Standing Ordrer No 119(4)

ආකෘතිය (අංක 01)
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක -79
ජනමාධ්‍ය අමාත්‍යාංශය

පළමු කොටස : 81.00		
අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
1.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.	2022 වර්ෂයට අදාළව අවදානම් ලේඛනයක් සකස් කර නැත. නමුත් මේ වන විට 2023 වර්ෂයට හා 2024 වර්ෂයට අදාළව අවදානම් ලේඛන සකසා යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබයි.
2.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම.	විගණන විමසුම් සඳහා අමාත්‍යාංශයේ විවිධ අංශ වෙතින් පිළිතුරු කැඳවා අවසන් පිළිතුර සකස් කිරීමේදී යම් ප්‍රමාදයන් ඇතිවේ. එවැනි අවස්ථාවල අතුරු පිළිතුරක් හෝ යොමු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
3.	සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.	කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා නිලධාරීන් සේවා මුර ක්‍රමය යටතේ සේවයට පැමිණීම හේතුවෙන් 2022 වර්ෂයට ආළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2022 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු සඳහා එක් රැස්වීමක්ද, තුන්වන කාර්තුව සඳහා එක් රැස්වීමක්ද, හතරවන කාර්තුව සඳහා එක් රැස්වීමක්ද ආදී වශයෙන් කාර්තු හතරම ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.
4.	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේකයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳව වන නිර්දේශයද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබීම.	නියමිත කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
5.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
6.	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබීම.	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

ඩී.පී.ඒ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, "අබිමානී මාවත", තිරිපුපුන මාවත,
කොළඹ-05.

7.	මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබීම.	බැඳීම් ඇතිකර ගැනීමේදී වර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය සමාලෝචනය කර ඒ අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාව නිලධාරීන් වෙත අවධාරණය කර ඇත.
8.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ සියල්ල මේ වන විට නිරවුල් කර ඇත.
9.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම.	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම කර මසක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත.

දෙවැනි කොටස : **83.50**		
අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
1.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කිරීමට කටයුතු සිදුකරමින් පවති.
2.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවැතීම	2022 වර්ෂයේ මුල් භාගයේ පුහුණුවීම් පැවැත්වීම සිදුකරනු ලැබුයේ මාර්ග ගත ක්‍රමය ඔස්සේ වන බැවින් පාඨමාලාවන් සඳහා නිලධාරීන් නම් කළද භෞතිකව පැවැත්වෙන පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගීවීමට කැමැත්තක් නොතිබුණි.
3.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ වීම.	2022 වර්ෂය සඳහා ලබාදී ඇත්තේ තත්වාගණනය කළ මතයකි .විගණනයේදී පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ඉදිරියේදී සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනීමට කටයුතු කෙරේ.

ඒ.ජී.කේ. අනුෂ පැල්පිට
දේශමි
ජ්‍යාමාන්‍ය ගණකාධිකාරී
163, "ඇසිඩියි මාවත", කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ-05.